# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ஆண்டிற்கான செயற்திறன் அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2020

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்**

**Land Commissioner General's Department**

## පටුන


පිටු අංක

**1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ** **4- 7**
- 1.1 හැඳින්වීම
- 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු
- 1.3 ප්‍රධාන කාර්යයන්
- 1.4 සංවිධාන සටහන
- 1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

**2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** **8- 11**
- 2.1 ප්‍රගතිය
- 2.2 විශේෂ වැඩසටහන්
- 2.3 ඉදිරි ඉලක්ක

**3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය** **12- 18**
- 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
- 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
- 3.4 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය
- 3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
- 3.6 මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන
- 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
- 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක** **19 - 20**
- 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

**5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය** **21 - 21**
- 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

**6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** **22 - 23**
- 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
- 6.2 මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය
- 6.3 මානව සම්පත් සංවර්ධනය

**7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව** **24 - 29**

# 1. පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත, රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යන පනත් මගින් රජයේ ඉඩම් හා සම්බන්ධ ඉඩම් කච්චේරි පැවැත්වීම, අඩු ආදායම්ලාභී පුද්ගලයන් වෙත නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබා දීම, බලපත්‍ර ලබා දීම, දීමනා පත්‍ර ලබා දීම ආදී කටයුතු මෙන්ම වැඩි ආදායම් පුද්ගලයන් සහ විවිධ ආයතන වෙත ද කෘෂිකාර්මික සහ වාණිජමය ආදී අවශ්‍යතාවයන් සඳහා දීර්ඝකාලීන බදු කර මෙන්ම නිදහස් දීමනාපත්‍ර ලබා දීම, රජයේ ඉඩම් බැහැර කිරීමේ දී කටයුතු කිරීමට අදාළ රාජකාරී යනාදී කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබයි.

## 1.2 දෙපාර්තමේන්තු දැක්ම

“රාජ්‍ය ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස නිරවුල් බිමක් හිමි සමාජයක් බිහිකිරීම”

### 1.2.1. මෙහෙවර ප්‍රකාශය

“ජාතික ප්‍රතිපත්තියක් තුල මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට මඟ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම”

### 1.2.2. දෙපාර්තමේන්තුවේ අරමුණු හා උපාය මාර්ග


| අරමුණු | උපාය මාර්ග |
|---|---|
| 1 ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම. | i ඉඩම් හිමිකම තහවුරු කිරීම.<br>ii රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීම. |
| 2 ආයෝජන අවස්ථා පුළුල් කිරීම. | i ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය කිරීම. |
| 3 රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය. | i රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සංවර්ධනය කිරීම.<br>ii රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම. |
| 4 දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම . | i මානව සම්පත සංවර්ධනය කිරීම.<br>ii භෞතික සම්පත ඵලදායි ලෙස භාවිතා කිරීම.<br>iii මූල්‍ය සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම. |
| 5 රාජ්‍ය ආදායම වර්ධනය කිරීමට දායකවීම | i ඉඩම් ආදායම් හඳුනාගැනීම හා ඇස්තමේන්තු කිරීම<br>ii ඉඩම් ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීම.<br>iii හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම. |

## 1.3 රජයේ ඉඩම් පරිපාලනය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී සුවිශේෂී වූ කාර්ය භාරයක් ඉටුකරනු ලබයි.

01. අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
02. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම.
03. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම, මේ යටතේ
    - නිවාස, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.
    - විශේෂ හා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම.
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම.
    - රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම.
04. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා දීමනාපත්‍ර නිකුත් කිරීම.
05. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම
06. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති වලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම.
07. රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය කිරීම.
08. රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට රජයේ ඉඩම් මත බදු අයකර ගැනීම කළමනාකරණය කිරීම.
09. මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම.
10. ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම.

# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන




**සූචිය**

- නි.ඉ.කො. - නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්
- ස.ඉ.කො. - සහකාර ඉඩම් කොමසාරිස්
- පරි.නි. - පරිපාලන නිලධාරී
- ජ්‍යෙ.වැ.අධි. - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී
- භාෂා පරි. - භාෂා පරිවර්තක

## 1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාල

මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු අන්තර් පළාත් වාරිමාර්ග ක්‍රම යටතේ පිහිටුවා තිබෙන්නා වූ ඉඩම් කොමසාරිස් කාර්යාල 06 ක් සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 ක් යටතේ සිදු කරනු ලබයි.

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.**

1. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අනුරාධපුරය
2. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - පොළොන්නරුව
3. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අම්පාර
4. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - ත්‍රිකුණාමලය
5. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - දෙබරවැව
6. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - මහියංගණය
7. සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - කන්තලේ
8. සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - මොණරාගල

### 1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශය I, ඉඩම් අංශය II, ඉඩම් අංශය III, පාලන අංශය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය වශයෙන් අංශ 06 ක් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වේ. මෙයින් ඉඩම් අංශ තුනෙහි හා පාලන අංශයේ ප්‍රධානීන් ලෙස ඉඩම් කොමසාරිස්වරු කටයුතු කරනු ලබන අතර ගිණුම් අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන ගණකාධිකාරී ද, අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක ද කටයුතු කරනු ලැබේ.

# 2. පරිච්ඡේදය
## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ප්‍රගතිය

| මූලික වගකීම | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව සැලසුම් කර ඇති ප්‍රධාන කාර්යයන් | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ දැක්වෙන පරිදි ප්‍රමුඛ කාර්යසාධක දර්ශකය | ප්‍රගතිය |
|---|---|---|---|
| ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් I, II, III, ප්‍රාදේශීය කාර්යාල, පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ | | |
| | ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කච්චේරි අනුමත කිරීම | **625** | 1906 |
| | ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත්) | **4000** | 732 |
| | ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම (පළාත් සභා) | **11000** | 7013 |
| | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම | **6967** | 17568 |
| | දීමනාපත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම, මුල් අයිතිය සහතික කිරීම, දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම, කොන්දේසි ලිහිල් කිරීම) | **1183** | 1455 |
| | මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම | **65** | 34 |
| | මධ්‍යම පාන්තික දීමනාපත්‍ර පැවරීමට අනුමැතිය ලබා දීම | **29** | 53 |
| | ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත යටතේ නියාදන සාදන දීමනාපත්‍ර සකස් කිරීම | **283** | 40 |
| | බලපත්‍ර හා දීමනා පත්‍ර ගැටළුවලට උපදෙස් ලබාදීම | **8000** | 6240 |
| | i ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම | **53** | 76 |
| | ii ඉඩම් ගැටළු සඳහා උපදෙස් ලබා දීම | **11500** | 25449 |
| | රජයේ ඉඩම් ආඥා පනත යටතේ | | |
| | රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු දීම සඳහා කච්චේරි අනුමත කිරීම | **135** | 120 |
| | රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු නිර්දේශ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | **3300** | 2510 |
| | රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර සකස් කිරීම | **330** | 191 |
| | බදුකර පසු කටයුතු (පැවරීම්, උකස් කිරීම්) | **60** | 81 |
| | i. නිදහස් දීමනාපත්‍ර සඳහා අමාත්‍යාංශ නිර්දේශ ඉදිරිපත් කිරීම | **150** | 91 |
| | ii. නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම | **340** | 319 |
| | UDA / NHDA දීමනාපත්‍ර සකස් කිරීම | **40** | 40 |
| | දෙපාර්තමේන්තුවලට ඉඩම් නිදහස් කිරීම | **285** | 364 |
| | i. සුනාමි දීමනාපත්‍ර ලබාදීම යටතේ අමාත්‍යාංශ වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම | **327** | 412 |
| | ii. සුනාමි දීමනාපත්‍ර සකස් කිරීම | **410** | 602 |
| | පූජාභූමි දීමනාපත්‍ර සකස් කිරීම | **77** | 79 |

| | | | |
|---|---|---|---|
| | ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතන සඳහා පැවරුම් නියෝග නිකුත් කිරීමට අමාත්‍යාංශ නිර්දේශ යැවීම | **97** | 101 |
| | උපදෙස් ලබාදීම | **8000** | 11511 |
| | ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පාලනය කිරීම | | |
| | i. ඉඩම් වලින් ඉවත් කිරීම | **167** | 0 |
| | ii. නඩු පැවරීම | | 3 |
| | iii. ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම් සංඛ්‍යාව | | 0 |
| | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම | | |
| | බදු නොගෙවා ඇති බදුකරුවන් හඳුනා ගැනීම | **235** | 0 |
| | බදුකරුවන් / අවසරපත්‍රලාභීන් දැනුවත් කිරීම හා හිඟ අයකිරීමට කටයුතු කිරීම | **167** | 0 |
| | අවසරපත්‍ර /බදුකර අවලංගු කිරීමට කටයුතු කිරීම | **8** | 4 |
| | නඩු පැවරීම | **4** | 0 |

## 2.2 විශේෂ වැඩසටහන්

### 2.2.1 බිම්සවිය වැඩසටහන

බිම්සවිය වැඩසටහන ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූලික දායකත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58 ක් තුළ ක්‍රියාවට නංවන ලද ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා දීමේ ජාතික වැඩසටහනක් ලෙස හඳුන්වා දිය හැක. අංක 2187/27 හා 2020.08.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟ එහි විෂය පථයට බිම්සවිය වැඩසටහන ඇතුළත් වූ නිසා එම කර්තව්‍ය ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මැදිහත්ව ඉටු කරන ලදි. මේ අනුව රජයේ ඉඩම් සඳහා මෙම වැඩසටහන යටතේ 2020 වර්ෂය අවසානය දක්වා බලපත්‍ර 278 ක් ද, කැඩැස්තර සිතියම් යටතේ දීමනාපත්‍ර සංඛ්‍යාව 1572 ද නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. ඉඩම් කච්චේරි 54 ක්, ජංගම සේවා 19 ක් හා කොට්ඨාශ දින 40 ක් ද පවත්වා ඇත. ඊට අමතරව ඉඩම් ගැටළු 1261 ක් සඳහා උපදෙස් ලබා දී ඇත.

### 2.2.2 රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතිය ක්‍රියාත්මක කිරීම

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය (State Land Information Management System) නිර්මාණය කිරීමට කටයුතු කර ඇත. රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන අතර ඉඩම් බෙදාදීි ලියකියවිලි නිකුත් කිරීම හා ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියද බෙදා දුන් ඉඩම් වලට අදාළ පසු කටයුතු හා අධීක්ෂණ කටයුතු ද මෙම පද්ධතිය මඟින් සිදු කිරීමට හැකියාව ඇත. 2013 වර්ෂයේ දී බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 කින් ආරම්භ වූ මෙම වැඩ සටහන 2020 වර්ෂය අවසන් වන විට දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332 හිම සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකි විය.

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ලේඛණ සංඛ්‍යාව) | 236,326 | 144,936 | 63,955 |
| අනුරේඛණ සහිතව ඉඩම්වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ඉඩම් කැබලි සංඛ්‍යාව) | 32,876 | 34,615 | 90,337 |
| නව දීමනා පත්‍ර ලබාදීම | 4,387 | 5,665 | 4,195 |
| බලපත්‍ර සංඛ්‍යාව | | | 115 |
| දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම | | | 11 |

2020 වර්ෂය තුල රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඉඩම් ලේඛන 100,000 ක් ඇතුලත් කිරීමට ඉලක්ක කර, ලේඛණ 63,955 ක් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුව සමත් විය. මීට අමතරව මෙම වර්ෂයේදී ද දීමනාපත්‍ර, වාර්ෂික අවසරපත්‍ර, දීර්ඝ කාලීන බලපත්‍ර ආදී සියලු ලේඛණ මෙම පද්ධතිය උපයෝගි කර ගනිමින් මුද්‍රණය කිරීම සිදුකර ඇත. ඒ අනුව දිමනාපත්‍ර පමණක් 4,195 ක් නිකුත් කිරිමට හැකි වුණි. මෙම වර්ෂ තුළ තුල රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ පුහුණු වැඩසටහන් 12 පවත්වන ලද අතර පුහුණු නිළධාරීන් සංඛ්‍යාව 390 කි.

**රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය තවදුරටත් ක්‍රියාත්මක කිරීම**

දිවයින පුරා සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

| විස්තරය | 2021 වර්ෂය සඳහා ඉලක්ක |
|---|---|
| බලපත්‍ර නිකුත් කිරීම | 2,000 |
| දීමනාපත්‍ර නිකුත් කිරීම | 10,000 |
| රජයේ ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම | 100,000 |

## 2.2.3 රජයේ ඉඩම් තොරතුරු රැස්කිරීමේ වැඩසටහන

රාජ්‍ය ඉඩම් කළමනාරණයේ පූර්ණ වගකීම මෙම දෙපාර්තමේන්තුව සතු බැවින් ආර්ථික සංවර්ධනයට අවශ්‍ය රජයේ ඉඩම් කඩිනමින් අදාළ පාර්ශව වෙත මුදාහැරීමත්, ඌන උපයෝජිත රජයේ ඉඩම් පූර්ණ උපයෝජනයට ලක් කිරීමට අවශ්‍ය ක්‍රමවේද සැකසීමත්, මෙම දෙපාර්තමේන්තුව සතු වගකීම් වේ. එබැවින් රජයේ ඉඩම් විධිමත්ව හඳුනාගැනීම හා විධිමත් රජයේ ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම උක්ත වගකීම් ඉටු කිරීමේදී ඉමහත් පිටුවහලක් වේ. ඒ අනුව එම අරමුණ පෙරදැරිව මුළු දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් තොරතුරු රැස්කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන ලදි. 2020 ඔක්තොම්බර් මස දී ආරම්භ වීමට නියමිතව තිබූ උක්ත වැඩසටහන නොවැලැක්විය හැකි හේතුවක් මත කල් දැමීමට සිදුවුව ද, 2020 දෙසැම්බර් මස දී එම වැඩසටහන ආරම්භ කරන ලදි. ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර 2021 මුල් කාර්තුව තුළ රැස්කරනු ලබන සියලුම දත්ත පරිගණක ගත දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත.

## 2.3 ඉදිරි ඉලක්ක

### 2.3.1. 2021 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත අනෙකුත් කාර්යන්ගේ ඉලක්ක පහතින් දක්වා ඇත.

| අනු අංකය | විස්තරය | 2021 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක |
|---|---|---|
| 01. | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම | 75,000 |
| 02. | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම | 50,000 |
| 03. | රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු සඳහා අමාත්‍යාංශය වෙත නිර්දේශ යැවීම | 5,000 |
| 04. | රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම | 5,000 |
| 05. | සුනාමි දීමනාපත්‍ර සකස් කිරීම | 450 |
| 06. | දෙපාර්තමේන්තුවලට ඉඩම් නිදහස් කිරීම | 1,500 |
| 07. | ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත යටතේ නියාදන සාදන පත්‍ර සකස් කිරීම | 200 |
| 08. | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම | 250 |
| 09. | පූජා භූමි දීමනාපත්‍ර සකස් කිරීම | 250 |
| 10. | ජංගම සේවා පැවැත්වීම | 500 |

..............................

ආයතන ප්‍රධානී

නම: ජී.ඩී. කීර්ති ගමගේ

තනතුර: ඉඩම් කොමසාරිස් ජනරාල්

දිනය: 2021.02. 19

ජී. ඩී. කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැඳුර"
ඉඩම් මහලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

## 3. පරිච්ඡේදය
## වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | තත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 100,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 105,011,391 | 110,745,021 | |
| **100,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **105,011,391** | **110,745,021** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 286,429,000 | 305,265,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 6,215,212 | 6,524,297 | ඒසීඒ-4 |
| 9,100,000 | අත්තිකාරම් ගිණුම් | | 18,014,197 | 22,407,806 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 11,718,580 | 11,932,764 | |
| **9,100,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **322,376,989** | **346,129,868** | |
| **109,100,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **427,388,379** | **456,874,889** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 370,150,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 363,888,827 | 302,387,177 | ඒසීඒ-2(ii) |
| 85,979,200 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 78,814,682 | 102,027,418 | ඒසීඒ-2(ii) |
| 2,013,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,966,974 | 2,395,262 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1,057,800 | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 1,027,936 | 498,635 | |
| **459,200,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **445,698,420** | **407,308,492** | |
| | **මූලධන වියදම්** | | | | |
| 18,370,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 17,767,822 | 31,077,903 | |
| 15,930,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 14,362,681 | 19,153,293 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | **14** | 455,470 | 1,985,392 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| **34,800,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **32,585,972** | **52,216,588** | |
| **20,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **23,562,330** | **36,987,518** | |
| | **තැන්පතු ගෙවීම්** | | 6,698,007 | 8,316,362 | **ඒසීඒ-4** |
| 20,000,000 | **අත්තිකාරම් ගෙවීම්** | | 16,864,324 | 28,671,156 | **ඒසීඒ-5** |
| **514,000,000** | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **501,846,722** | **496,512,598** | |
| **(404,900,000)** | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)** | | **(74,458,343)** | **(39,637,709)** | |

**3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**ඒසීඒ-පී**

## 2020 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,816,348,797 | 1,515,795,500 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 63,809,604 | 64,959,477 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 674,099 |
| **මුළු වත්කම්** | | **1,880,158,401** | **1,581,429,076** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | (3,864,233) | (3,197,155) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,816,348,797 | 1,515,795,500 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 67,673,837 | 68,156,632 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 674,099 |
| **මුළු වගකීම්** | | **1,880,158,401** | **1,581,429,076** |

පිටු අංක 5 සිට 41 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 46 සිට 56 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
|---|---|---|
| ආර්.ඒ.ඒ.කේ. රණවක | ජී.ඩී. කීර්ති ගමගේ | ඊ.ඩී. කුමුදු |
| ලේකම්, ඉඩම් අමාත්‍යාංශය | ඉඩම් කොමසාරිස් ජනරාල් | 2021.02. 12 |
| 2021.02. | 2021.02. | |

ආර්. ඒ. ඒ. කේ. රණවක
ලේකම්
ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය
අංක. 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ජී. ඩී. කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

E. D. Kumudu
Chief Accountant
Land Commissioner General's Department
"Mihikatha Medura"
No. 1200/6, Rajamalwatta Road, Battaramulla

**3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

**ඒසීඒ-සී**

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සතය 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | 11,396,791 | 13,050,723 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 68,057 | 239,656 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 10,570,968 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 10,573,951 | - |
| අග්‍රිම ලැබීම් | 286,429,000 | 305,265,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **308,467,799** | **329,126,347** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 266,547,244 | 261,625,825 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,294,942 | 1,637,546 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 11,477,695 | 16,076,254 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 7,509 | 32,468 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **279,327,390** | **279,372,092** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **29,140,409** | **49,754,255** |

| | | |
|---|---|---|
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | 1,086,495 | 1,293,891 |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 58,134 | 67,905 |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 8,428,376 | 11,753,435 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **9,573,005** | **13,115,231** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 29,171,619 | 51,320,531 |
| අත්තිකාරම් ගෙවීම් | 9,059,000 | 9,082,791 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **38,230,620** | **60,403,322** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(28,657,614)** | **(47,288,091)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **482,795** | **2,466,163** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 6,215,212 | 6,524,297 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **6,215,212** | **6,524,297** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 6,698,007 | 8,316,362 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **6,698,007** | **8,316,362** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(482,795)** | **(1,792,065)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **0** | **674,099** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **0** | **674,099** |

**3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය** රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.02.01.03 | ඉඩම් හා අනෙකුත් බදු කුලී | 100,000 | 100,000 | 105,011.4 | 5% |

**3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය** රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 461,900 | 459,200 | 445,698.4 | 97.06 |
| ප්‍රාග්ධන | 32,100 | 34,800 | 32,586 | 93.64 |

**3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික් ලේකම් | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | ඉඩම් අමාත්‍යාංශය | දුරකථන, චිලර්, විදුලි සෝපාන, වායු සමීකරණ | 64.7 | 832.74 | 822.75 | 98.80 |
| 2 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | PABX, විදුලි සෝපාන, වායු සමීකරණ | 137.5 | 363.46 | 285.06 | 78.42 |
| 3 | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ | 647.94 | 647.94 | 647.94 | 100 |
| 4 | රාජ්‍ය සේවා, පළාත් සභා පළාත් පලාන අමාත්‍යාංශය | වැටුප් | 280 | 500 | 411.33 | 82.26 |
| 5 | ඉඩම් කළමණාකරණ, රාජ්‍ය ව්‍යාපාර දේපල සංවර්ධන අමාත්‍යාංශය | PABX | 125 | 125 | 125 | 100 |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 2020 වර්ෂයට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ප්‍රාදේශීය කාර්යාලවලින් ලැබෙමින් පවතියි. | 936,104.5 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 118,850.34 | | |
| 9153 | ඉඩම් | | 761,393.96 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

## 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම I මගින් දක්වා ඇත.

# 4. පරිච්ඡේදය
## ආයතනයේ කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කච්චේරි 625 ක් පැවැත්වීම | 100% | | |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ (අන්තර් පළාත්) බලපත්‍ර 4,000 ක් සකස් කිරීම. | | | 18 % |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ (පළාත් සභා) බලපත්‍ර 11,000 ක් සකස් කිරීම. | | | 64% |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර 6967 ක් සකස් කිරීම | 100 % | | |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර පසු කටයුතු 1183 ක් ඉටු කිරීම | 100 % | | |
| මධ්‍යම පාන්තික දීමනාපත්‍ර 65 ක් ලබාදීම | | | 52 % |
| මධ්‍යම පාන්තික දීමනාපත්‍ර පැවරීම් 29 කට අනුමැතිය ලබා දීම | 100 % | | |
| ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ දීමනාපත්‍ර 283 ක් ලබාදීම | | | 14 % |
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ කච්චේරි 135 ක් පැවැත් වීම | 89 % | | |
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු නිර්දේශ 3,300 ලබාදීම | | 76% | |
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර 330 නිකුත් කිරීම | | | 58 % |
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු කර පසු කටයුතු පැවරීම්, උකස්කිරීම් 60 | 100 % | | |
| නිදහස් දීමනා පත්‍ර සඳහා අමාත්‍යාංශය නිර්දේශ 150 ලබාදීම | | | 61 % |
| නිදහස් දීමනා පත්‍ර දීමනාපත්‍ර 340 ක් ලබාදීම | 94% | | |
| ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතන සඳහා පැවැරුම් නියෝග 97 ක් සඳහා නිර්දේශ යැවීම | 100 % | | |
| දෙපාර්තමේන්තු වලට ඉඩම් 285 ක් නිදහස් කිරීම | 100 % | | |
| සුනාමි දීමනාපත්‍ර ලබා දීම යටතේ අමාත්‍යාංශ නිර්දේශ 327 ක් ලබා දීම | 100 % | | |
| සුනාමි දීමනාපත්‍ර 410 ක් ලබාදීම | 100 % | | |
| පූජාභූමි දීමනාපත්‍ර 77 ක් ලබාදීම | 100 % | | |
| UDA / NHDA දීමනාපත්‍ර 40 ක් ලබාදීම | 100 % | | |
| ඉඩම් බලපත්‍ර හා දීමනා පත්‍ර ගැටළු 16,000 ක් සඳහා උපදෙස් ලබාදීම | 100 % | | |
| රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණ පද්ධතිය මගින් බලපත්‍ර 3,000 ක් සකස් කිරීම | | | 4% |
| රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණ පද්ධතිය මගින් දීමනා පත්‍ර 10,000 ක් සකස් කිරීම | | | 70 % |

| | | | |
|---|---|---|---|
| රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණ පද්ධතිය මගින් ඉඩම් කැබලි 100,000 ක තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම | | | 64% |
| පසු විපරම් කටයුතුවල නිරතවන නිලධාරීන්ගේ හා යටිතල පහසුකම් පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම හා අධීක්ෂණ කටයුතුවල නිරතවන නිළධාරීන්ගේ පහසුකම් වෙනුවෙන් ගොඩනැගිලි 10 ක් පුනරුත්තාපනය කිරීම | 100% | | |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල මගින් අනවසර අල්ලා ගැනීම් ඉඩම් කැබලි 167 ක් පාලනය කිරීම | | | 56% |
| ජංගම සේවා වැඩසටහන් 53 පැවැත්වීම | 100 % | | |
| ජංගම සේවා මගින් ඉඩම් ගැටළු 11,500 ක් සඳහා විසඳුම් ලබාදීම | 100 % | | |
| මානව සම්පත් සංවර්ධනය කිරීම යටතේ නිලධාරීන් 850 ක් සඳහා පුහුණුව ලබා දීම | | | 15% |
| රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණය කිරීම යටතේ නිළධාරීන් 1050 ක් සඳහා පුහුණුව ලබාදීම | | | 37% |
| ඉඩම් කැබලි 167 ක් පාලනය කිරීම | | | 56% |

## 5. පරිච්ඡේදය
## තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| (තිරසාර සංවර්ධන අරමුණු 1.4) විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපල උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත්) | බලපත්‍ර 4,000 ක් සකස් කිරීම. | 18.30% | | |
| | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම (පළාත් සභා) | බලපත්‍ර 11,000 ක් සකස් කිරීම. | | 63.75% | |
| | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම | දීමනාපත්‍ර 6,967 ක් සකස් කිරීම | | | 100% |

### 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2020 වර්ෂයේ දී සාමාන්‍ය රාජකාරි යටතේ බලපත්‍ර 7,745 ක් හා දීමනා පත්‍ර 17,568 ක් සකස් කරන ලදි. එමෙන්ම රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතිය ඔස්සේ බලපත්‍ර 115 ක් සහ දීමනා පත්‍ර 7,037 ක් සකස් කර ඇත.

# 6. පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම මත | ඇබෑර්තු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 53 | 42 | 4 | 11 |
| තෘතීක | 38 | 6 | 1 | 32 |
| ද්විතියික | 674 | 491 | 7 | 183 |
| ප්‍රාථමික | 140 | 97 | 2 | 43 |

- ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර ඉඩම් කොමසාරිස්, ගණකාධිකාරි, මිනින්දෝරු, නීති නිළධාරි තනතුරු ඇතුළත් වේ.
- තෘතීක මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස පරිපාලන නිළධාරී, ජනපද නිළධාරී (විශේෂ), ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි, භාෂා පරිවර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරි තනතුරු ඇතුළත් වේ.
- ද්විතියික මට්ටමේ පවතින තනතුරු ලෙස සංවර්ධන නිළධාරී, වැඩ අධිකාරි, ජනපද නිළධාරි, සැලසුම් ශිල්පි, කළමනාකරණ සේවා නිළධාරි, ක්ෂේත්‍ර උපදේශක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, ලේඛන භාරකරු තනතුරු ඇතුළත් වේ.
- ප්‍රාථමික මට්ටම යටතේ පවතින තනතුරු ලෙස රියදුරු, මෝටර් කාර්මික, කාර්යාල කාර්ය සහායක, කාර්යාල කම්කරු, සංචාරක බංගලා භාරකරු, සංචාරක බංගලා කම්කරු, මැනුම් සහායක, ගබඩාකරු, මුරකරු යන තනතුරු ඇතුළත් වේ.

## 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපෑ ආකාරය

ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇතත් සියළු පුරප්පාඩු පුරවාගත නොහැකි වී ඇත. එමෙන්ම දෙපාර්තමේන්තුගත පත්කිරීම්වල ද සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් පවති. එහෙත් ඉඩම් කොමසාරිස්, වැඩ අධිකාරි, ජනපද නිළධාරි හා සංචාරක බංගලා භාරකරු යන තනතුරු වල පුරප්පාඩු මේ වනවිට සම්පූර්ණ කරගත නොහැකි වීම හේතුවෙන් ඇතැම් සේවාවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිළධාරීන් යම් ප්‍රමාණයකගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.

දෙපාර්තමේන්තුවේ සිටින නිළධාරීන් අතර දෙපාර්තමේන්තුවට අයත් රාජකාරී ප්‍රමාණය බෙදීයාම හේතුවෙන් නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය, ඵලදායීතාවයට යම් බලපෑමක් ඇති වන අතර, මෙම මානව සම්පත් හිඟය මඟ හරවා ගත හැකි නම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය තවදුරටත් ඉහළ නැංවීමට ඉවහල්වනු ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණුවලත් නිලධාරින් සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රුපියල්) | | වැඩසටහනේ පරමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| රජයේ ඉඩම් ආඥාපනත පිළිබඳ මූලධර්ම,ප්‍රායෝගික භාවිතය හා ගැටළු සාකච්ඡාව | 100 | දින 01 | 35,250.00 | | රජයේ ඉඩම් ආඥාපනත හා ඉඩම් සංවර්ධන ආඥාපනත පිළිබඳ මූලධර්ම, ප්‍රායෝගික භාවිතය හා ගැටළු පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම. |
| රජයේ ඉඩම් ආඥාපනත හා ඉඩම් සංවර්ධන ආඥාපනත පිළිබඳ මූලධර්ම,ප්‍රායෝගික භාවිතය හා ගැටළු සාකච්ඡාව-පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය | 27 | දින 01 | 18,260.00 | | රජයේ ඉඩම් ආඥාපනත හා ඉඩම් සංවර්ධන ආඥාපනත පිළිබඳ මූලධර්ම, ප්‍රායෝගික භාවිතය හා ගැටළු පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම. |
| ආරක්ෂාකාරී හා පිරිමැසුම් දායක රිය පැදවීම පිළිබඳ පුහුණුව-එන්.ඒ.එම් උස්මි | 1 | දින 01 | 3,500.00 | | විද්‍යාත්මක, පිරිමැසුම්දායක හා ආරක්ෂාකාරීව වාහන පැදවීම පිළිබඳ පුහුණුව ලබා දීම |
| විශ්‍රාම වැටුප් පිළිබඳ පුහුණුව-ජී.ජී.ජී.එන්. චන්ද්‍රතිලක මිය හා නිසංසලා හෙට්ටිආරච්චි මිය | 2 | දින 01 | 10,000.00 | | විශ්‍රාම වැටුප් සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය පුළුල් කිරීම |
| Master in Business Administration-එන්.ඒ.බී.එම් නිලවකආරච්චි (ස.ඉ.කො-ආයතන) | 1 | වසර 02 | 150,000.00 (තුන්වන වාරිකය) | | ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කල යුතු පශ්චාත් උපාධි පාඨමාලාවකි |
| Master of Business Administration in Accounting & Information Management-අනුරාධා ගුණතිලක (ගණකාධිකාරි) | 1 | වසර 02 | 245,000.00 (පළමු වාරිකය) | | ගණකාධිකාරි වෘත්තියෙහි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීමට අදාලව සම්පූර්ණ කල යුතු පශ්චාත් උපාධි පාඨමාලාවකි |

### 6.3.1. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවූ ආකාරය

දැනුම, කුසලතා හා ආකල්පවලින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් තුළින් කාර්යක්ෂම සඵලදායි හා ගුණාත්මක මහජන සේවයක් සැපයීම සඳහා වසර පුරාම විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

විශේෂයෙන්ම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් හඳුනාගත් අවශ්‍යතා මත පුහුණු වැඩමුළු පැවැත්වීම මගින් රාජකාරි කටයුතු වලදී උද්ගතවන ගැටළු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබාදීම, ඉඩම් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය පිළිබඳ ගැටළු හඳුනාගෙන සාකච්ඡා කරමින් විසඳුම් ලබාදීම, ඉඩම් මැනුම්කරණය හා සිතියම්ගත කිරීම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීමෙන් ඉඩම් ක්ෂේත්‍ර රාජකාරි වලදී ඇති වන ගැටළුවලට පිළියම් ලබාදීම හා ආයතනමය රාජකාරිවලදී නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු නීති/රීති හා රාජකාරිමය පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා දීම මගින් කාර්යක්ෂම සේවාවක් දෙපාර්තමේන්තුවට ලබා දීමට හැකි වීම. එමගින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නංවාගැනීමට දායකත්වයක් ලැබිණි.

## 7. පරිච්ඡේදය
## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අපහරණය කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කළ අතර වාහන අපහරණය කිරීමකින් තොරව අවශ්‍යතාවන් ඇති රජයේ ආයතන වෙත ලබා දීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ඒ පිළිබඳව විමසා ලිපි යොමු කර ඇති අතර එලෙස වාහන අවශ්‍යතාවයක් නොමැති බව එම දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව දන්වා ඇත. ඉන්පසුව දෙපාර්තමේන්තු රාජකාරි සඳහා පවතින වාහන අවශ්‍යතාවය සලකා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ලබා දුන් උපදෙස් අනුව එම වාහන දෙක අළුත්වැඩියා කිරීමට යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල නොවේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | කපා හැරීම් සඳහා මු.රෙ. අනුමැතිය ලැබී ඇත. 2020 වසරේ ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපාදන නොලැබුන බැවින් 2021 වර්ෂයේ දී කපා හැරීමට නියමිතය. | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේ දී සකස් කිරීමට සටහන් කර ඇත. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | 2021 වර්ෂයේ සිට මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීමට සැලසුම් කර ඇත. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම | | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල නොවේ | | 2021 වර්ෂයේ සිට මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීමට සැලසුම් කර ඇත |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

මගේ අංකය / எனது இல. / My No. AGL/A/LCG/2/2020/06 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 සැප්තැම්බර් ෆ8 දින

ගණන්දීමේ නිලධාරී

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික

ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.1 (ආ) | වැඩ තහනම් කළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.406,509ක ණය ශේෂ වර්ෂ 05 සිට 13 දක්වා කාල පරාසයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග අවසන් කර ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| 1.6.1 (ඇ) | සේවය හැරගිය නිලධාරීන්ගේ ණය ශේෂ වහාම පියවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවීමට තිබූ රු.349,195 ක ණය මුදල වර්ෂ 03 සිට වර්ෂ 22 ක් දක්වා කාල පරාසයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | හිඟ හිටි ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| 2.1 (අ) | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශ මගින් බදු ආදායම් රැස්කරන අතර 2019 වර්ෂයේ බදු ආදායම රු.110,745,021ක් විය. 2019 වර්ෂය අවසන් දිනට පැවති රු.28,746,016ක් වූ හිඟ බදු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු. රෙ. 175(2) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 4(ආ) ඡේදය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම හා සමුච්චිත හිඟ ආදායම ඉහළ යාම පාලනය සඳහා ක්ෂණික පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| 2.1 (ආ) | රජයේ ඉඩම්වල බදු ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ බදු ආදායමෙන් රු. 13,510,627 ක් හෙවත් සියයට 47 ක් වසර 02කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 07 කට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් මගින් රැස් කළ යුතු රු.7,910,261 ක හිඟ ආදායම් වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | රජයේ ඉඩම් බදු ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස් කළ යුතුය. |
| 2.5 | 2019 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.68,156,632ක් වූ පොදු තැන්පතු ශේෂයෙහි ඇතුළත් වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු 48 කට අදාළ රු.66,460,406 ක් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.1.1 භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශන සැසඳීම.

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන ( SA-82 )අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති මූල්‍ය නොවන වත්කම්වල මුළු වටිනාකම රු. 1,816,218,897 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එම වටිනාකම රු. 1,816,348,797 ක් වීම හේතුවෙන් එම ලේඛන අතර රු. 129,900 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ( ACA-6) ඇතුළත් ඉඩම් , කාර්යාල ගොඩනැගිලි , කාර්යාල උපකරණ , පරිගණක උපකරණ හා ගෘහභාණ්ඩ යන වත්කම්වල ආරම්භක ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත පරිගණක සටහනේ සඳහන් ආරම්භක ශේෂ අතර රු. 299,741,661 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ(ACA-6) සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම වටිනාකම රු.317,375,386 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ(SA-82) එම වටිනාකම රු.17,503,825 ක් ලෙසදැක්වීම හේතුවෙන් එම වටිනාකම් දෙක අතර රු.299,871,561 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.1.2 ගිණුම්ගත නොවූ ඉඩම් හා ගොඩනැගිලි

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලවලට හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවලට අයත් ඉඩම් 34 ක් හා ඒවායේ පිහිටි ගොඩනැගිලි 45න් අබලන් තත්වයේ පවතින ගොඩනැගිලි හඳුනාගෙන ඒවා අලුත්වැඩියා කිරීමට හා ඒවාද ඇතුළත්ව භාවිතයට ගතහැකි ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ජංගම නොවන වත්කම් වටිනාකම මඟින් සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් නොකරන බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමණාකරණය

(අ) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අන්තර් පළාත් ගොවි ජනපද මඟින් ඉඩම් බදු ආදායම් රැස්කරන අතර සමාලෝචිත වර්ෂය අවසන්වන විට රු.57,991,589 ක හිඟ බදු ආදායමක් පැවති අතර එම ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.හිඟ බදු ආදායමෙන් සියයට 60 ක් හෙවත් රු.34,774,562 ක් වසර 2 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කළ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2.1 පරිච්ඡේදයට අනුව හිඟ ආදායම් අයකර ගැනීමට අපේක්ෂිත නීත්‍යානුකූල පියවර ලෙස, බදු නොගෙවන බදුකරුවන් 235 ක් හඳුනා ගැනීම, බදුකරුවන් 167 ක් දැනුවත් කිරීම හා හිඟ අයකර ගැනීම , බදු කර 8 ක් අවලංගු කිරීම හා නඩු 04 ක් දැමීම සඳහන් වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට බදුකර 04 ක් අවලංගු කිරීම හැර අන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. ඒ අනුව හිඟ බදු අයකර ගැනීමේ ක්‍රියාවලිය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

## 2.2 වියදම් කළමණාකරණය

මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙළ කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත් පහත සඳහන් ඇස්තමේන්තු කිරීමේ අඩුපාඩු පැවතුණි.

(අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 04ක වැඩ ආරම්භ කර නොතිබීම හේතුවෙන් වැය විෂය අංක 286-2-1-2105 සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කළ රු.1,300,000ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතුරු වී තිබුණි.

(ආ) වැය විෂය අංක 286-2-1-1409 සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කල රු.39,810,000 ක ප්‍රතිපාදන මුදලින් මු.රෙ 66 සහ 69 මඟින් රු.2,600,000 ක් පිටතට මාරු කිරීමෙන් පසුවද රු. 5,824,851 ක් හෙවත් සියයට 16ක් ඉතිරි වී තිබුණි.

## 2.3 නීති,රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

| | නීති රීති රෙගුලාසිය | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 371 (5) | නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්යය නිම කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද , සමාලෝචිත වර්ෂයේ දී අවස්ථා 15ක දී ලබා දුන් රු.426,500ක අත්තිකාරම් පියවීම සඳහා දින 59 සිට දින 153 අතර කාලයක් ගත වී තිබුණි. |

(ආ) රාජ්‍ය පරිපාලන හා
කළමණාකරණ අමාත්‍යාංශ
චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛනයේ ඇමුණුම 02 ආකෘතිය | චක්‍රලේඛයේ ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇති ආකෘතිය පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සැලැස්ම පිළියෙළ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කර ක්‍රියාත්මක කළ යුතු වුවද,ඒඅනුව කටයුතු කර නොතිබුණි. |

**2.5 තැන්පතු**

පොදු තැන්පතු ගිණුම් 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.67,673,837 ක ශේෂයෙහි ඇතුළත් වසර 2ක් ඉක්මවූ රු.65,027,738ක තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.6 රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(අ) වැඩ තහනම් කළ නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවියයුතු මුළු ණය ශේෂය වූ රු.589,527ක් තුළ වර්ෂ 11 ඉක්මවූ රු.117,801ක් ද,වර්ෂ 6ත් 8ත් අතර පවතින රු.281,085ක්ද වර්ෂ 3ත් 4ත් අතර කාල පරාසයක සිට හිඟව පවතින රු.46,944ක ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේXXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 143,900ක ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාර්යන් ඉටු නොකිරීම

**ඉඩම් ලේඛනයක් පවත්වා නොතිබීම**

ලංකාවේ මුළු භූමි පමාණයෙන් සියයට 20 ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ සෘජු වගකීම දෙපාර්තමේන්තුවට පැවරේ. එම ඉඩම් වලට අදාළව, 1931 වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට බැහැර කිරීම සටහන් කරමින් යාවත්කාලීන කරන ලද ඉඩම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

#### 3.1.2 අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම.

රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම/ State Land Information Management System( E – Slims )

(අ) රජයේ ඉඩම් කළමණාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා මෙම තොරතුරු කළමණාකරණ පද්ධතිය 2013 වර්ෂයේ දී ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ වෙනුවෙන් දරා ඇති පිරිවැයරු.142,328,834 ක් වී තිබුණි.වර්ෂ 07 කට වැඩි කාලයක සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණ ද අදාළ දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කළ ඉඩම් කැබලි ප්‍රමාණය 1,128,249 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට සැලසුම් කළ ඉඩම් කැබලි 100,000 න් 90,331 ක් පමණක් ඇතුළත් කර තිබුණි.

(ආ) රජයේ ඉඩම් බදු දීම තුළින් ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල 09 ක් හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 08 ක් මගින් සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ දී රැස් කරන ලද ආදායම හා සමාලෝචිත වර්ෂය අවසන්වන විට හිඟ බදු වටිනාකම සම්බන්ධ තොරතුරු මෙම පද්ධතිය මගින් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී මෙම පද්ධතිය මගින් දීමනාපත්‍ර 10,000 ක් ලබාදීමට සැලසුම් කර තිබුන ද ලබා දී තිබූ ප්‍රමාණය 4,195 හෙවත් සියයට 42 ක් පමණක් විය.

### 3.2 වත්කම් කළමණාකරණය

(අ) අවශ්‍යතා ප්‍රමාණය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව 2016 වර්ෂයේදී මිලට ගනු ලැබූ මුළු වටිනාකම රු.226,700 ක් වූ වැබ් යන්ත්‍ර 03ක් ,අඟල් 40 LED රූපවාහිනී යන්ත්‍ර 01ක් හා සංඛ්‍යාංක බහු මාධ්‍ය ප්‍රොජෙක්ටර 1 ක් (Digital Multimedia Projector)2021 ජූලි 31 දින වන විටත් අභාවිතව ගබඩාවේ රඳවාතිබුණි.

(ආ) 2018 මාර්තු 28 දිනැති අංක - 01/2018 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ වගන්ති අංක 1.2.3 හා 1.2.4 ප්‍රකාරව රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන අනෙකුත් ආයතනයන්ගෙන් ලබාගත් අනවසර අල්ලා ගැනීම් පිළිබඳ තොරතුරුද ඇතුළත් මාසික වාර්තාවක් ප්‍රාදේශිය ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාසික රැස්වීමට යොමු කළ යුතු අතර එහි සමාලෝචන වාර්තාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය. අනවසර අල්ලා ගැනීම් පිළිබඳ නෛතික හා අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉඩම් බලධරයා ලෙස ප්‍රාදේශිය ලේකම් දරන වියදම් සඳහා ප්‍රතිපාදන ලබා දීමඉඩම් කොමසාරිස් ජනරාල් විසින් සිදු කළද, අනවසර අල්ලාගැනීම් පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අවම මට්ටමක පැවතීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අනවසරයෙන් අල්ලා ගත් ඉඩම් ප්‍රමාණය 13,167 ක් ලෙස දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තා මගින් ඉදිරිපත්කර තිබුණි.

(ඇ) නිල නිවාස උපයෝජනය

(i) පොළොන්නරුව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය යටතේ පවතින නිල නිවාස 18 ක් ප්‍රයෝජනවත් කාර්යකට යොදාගෙන නොමැති අතර වත්කම් කළමණාකරණ දුර්වලතා හේතුවෙන් එම නිල නිවාසවලින් 8 ක් අබලන්ව පැවතිණි.

(ii) ත්‍රිකුණාමලය අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයට අයත් නිල නිවාස 04 ක් අවුරුදු 03 ත් 12 ත් අතර කාල පරාසයක සිට අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම මත භාවිතයට ගෙන නොතිබූ අතර තවත් නිල නිවාස 09 ක් විනාශ වී ඇති බවත් අනාවරණය විය.

## 3.3 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ පොත්වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන (ii)හි මු.රෙ. 109 යටතේ ආරම්භක කපා නොහළ ශේෂය යටතේ දක්වා තිබූ එකතුව රු.1,138,193 ක් වූ අලාභයන් අය කර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසන්වන විටත්කටයුතු කර නොතිබුණි.

## 3.4 කළමණාකරණ දූර්වලතා

### බදු ඉඩම් කළමණාකරණය

තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි රජය සතු ඉඩම් බදු දීමට අදාළව පහත නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(අ) රජය සතු ඉඩම් 05 ක් පෞද්ගලික පාර්ශ්ව 03 කට හා රාජ්‍ය ආයතන 02 කට වාර්ෂික බදු පදනම මත ලබා දී තිබූ අතර එම බදු කරුවන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසන්වන විට අය විමට පැවති රු. 106,357,656ක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) ඉඩමහෙක්ටයාර් 0.0202 ප්‍රමාණයක්නේවාසික කටයුත්තක් සඳහාඅමරානන්ද රත්නායක යන අයට වර්ෂ 30 ක කාලයක් සඳහා බදු දී තිබුණ ද බදු ගිවිසුමේ 4වන වගන්තිය ප්‍රකාරව බදු අරමුණ වෙනුවෙන් මෙම ඉඩම යොදාගෙන නොමැති බවප්‍රාදේශීයලේකම් විසින් දෙපාර්තමේන්තුවට දන්වා තිබිය දී, අදාළ ඉඩම නැවත පවරා ගැනීමට හෝ විධිමත්ව බදු දීමටකටයුතු නොකර බදු හිමිකම බදුකරුගේ දියණියට පවරා දී තිබුණි.

(ඇ) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි හෙක්ටයාර් 1.163 ( පර්චස් 416 ) ක ඉඩමක් වර්ෂ 30ක කාලයක් සඳහා 1956 වර්ෂයේ සිට අවස්ථා දෙකකදී ඕටර්ස් ඇක්වටික් ක්ලබ් ආයතනය වෙත බදු දී තිබූ අතර දෙවන බදු කාලය 1989 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී තිබුණද, එම බදු කාලයට අදාළව බදුකරයක් නිකුත්කිරීමට දෙපාර්තමේන්තුව අපෝසත් වී තිබූ අතර අදාළ බදු කාලය 2019 වර්ෂයේදී අවසන් වුවද බදු ඉඩම නැවත පවරාගැනීමට හෝ නැවත බදුදීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) කිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි රූඩ්.01 පර්චස් 17.5 ක හා අක්කර 01 රූඩ් 01 පර්චස් 5.06 ක රජයේ ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම යටතේ පිළිවෙලින් 1977 නොවැම්බර් 30 වන දින හා 1987 ජනවාරි 01 දින සිට වර්ෂ 30 ක කාලයක් සඳහා"80 සමාජය" නම් ක්‍රීඩා සමාජය වෙත බදුකරයක් නොමැතිව බදු දී තිබුණි. කාලය අවසන් වීම හේතුවෙන් බදුකාලය දීර්ඝකර තිබුණද ඒ සඳහා ද බදුකරයක් නිකුත්කර නොතිබුණි.

## 4 තිරසර සංවර්ධනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත් ) එම පනත යටතේම පළාත් සහා බලපත්‍ර සකස් කිරීම හා දීමනා පත්‍ර සකස් කිරීම ලෙස ඉලක්ක තුනක් හඳුනාගෙන ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට අදාළ කාර්යයන් හි ප්‍රගතිය පිළිවෙළින් සියයට 18 ක් සියයට 64 ක් හා සියයට 100 ක් ලෙස දක්වා තිබුණි. අඩු ප්‍රගතියක් පෙන්වන ඉලක්ක සම්බන්ධයෙන් පවතින අභියෝග කාර්යසාධන වාර්තාව මඟින් අනාවරණය කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5 කාර්ය මණ්ඩල කළමණාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 53 | 42 | 11 |
| තෘතියික | 38 | 06 | 32 |
| ද්විතීක | 674 | 491 | 183 |
| ප්‍රාථමික | 140 | 97 | 43 |
| | 905 | 636 | 269 |

ඉහත කොරතුරුවලට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් හා තෘතියික හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 215 ක් ඇතුළු සමස්ත පුරප්පාඩු 269 ක් පැවතුනද,එම පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ අනුමත වී තිබූ ඉඩම් කොමසාරිස් තනතුරු 07 ක්, සහකාර ඉඩම් කොමසාරිස් තනතුරු 03 ක් හා මිනින්දෝරු තනතුරක යන පුරප්පාඩු 11 ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සැළසුම් ගත ඉලක්ක හා අරමුණු ළඟා කර ගැනීම දුෂ්කර වී තිබුණි.

ආර්.එම්.රත්නායක

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

ආර්. එම්. රත්නායක
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය